ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
**National Secretariat for Elders**

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
**Ministry of Rural Development, Social Security and Community Empowerment**

*සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා* -செயலூக்கமான முதுமையை நோக்கி- *Towards an active ageing*

| මගේ අංකය / எனது இல. / My No. | NSE/DEV/07 | ඔබේ අංකය / உனது இல. / Your No. | | දිනය / திகதி / Date | 2025.04.10 |
|---|---|---|---|---|---|

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ආධාරක උපකරණ ලබාදීම - 2025</u>**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් 2025 වර්ෂයට අදාළව ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් අතුරින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ආධාරක උපකරණ ලබාදීම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසා ඇත.

02. ඒ අනුව වයස අවුරුදු 60 සම්පූර්ණ වූ අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ශ්‍රවණ උපකරණ , ඇස් කණ්නාඩි හා අක්ෂි කාච ලබාදීමට කටයුතු කරන බව දන්වා සිටිමි. එම උපකරණ ලබා සඳහා 2025 වර්ෂයට අදාළ අයදුම්පත් මගින් අයදුම් කල යුතු අතර එම අයදුම්පත් සමඟ ඇමුණුම 01 ආකෘතිය සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව අධ්‍යක්ෂගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. එසේම ශ්‍රවණ උපකරණ ලබාදීම වැඩසටහන යටතේ අයදුම්පත් යොමු කිරීමේදී වෛද්‍ය වාර්තාව (AUDIOMETRY) අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු අතර, අක්ෂි කාච ලබාදීමේ වැඩසටහන යටතේ අක්ෂි ශල්‍යකර්මය සිදු කල බවට අදාළ වෛද්‍ය වාර්තාව ( ඇමුණුම 02 ) ප්‍රාදේශීය ලේකම් මගින් අප වෙත එවිය යුතුය.

04. උක්ත වැඩසටහන් වලට අදාළ අයදුම්පත්‍රය, උපදෙස් පත්‍රිකාව , ඇමුණුම 01 ආකෘතිය (අයදුම්පත් සමඟ එවීමේ පොදු ආකෘතිය), ඇමුණුම 02 ආකෘතිය (ශල්‍යකර්ම සිදු කල බවට වාර්තාව) www.srilankaeldercare.gov.lk වෙබ් අඩවියේ පලකෙරෙන බැවින් ඒ මගින් ද තොරතුරු ලබාගත හැකිය.

05. තවද මේ වන විටත් ආධාරක උපකරණ ලබා ගැනීම සඳහා අයදුම්පත් යොමු කර ඇතත් 2024 වර්ෂයේදී ප්‍රතිලාභ හිමිනොවූ ප්‍රතිලාභීන් සඳහා ඇමුණුම 01 මගින් අදාළ ඉල්ලීම සිදු කල යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි. ( නැවත අයදුම්පත්‍ර යොමු කිරීමේ අවශ්‍යතාවයක් නොමැත )

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ. චතුර මිහිදුම්
අධ්‍යක්ෂ

පිටපත : සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - කාරු.දැ. ගැ. ස. සහ අ.ක.ස.

ලිපිනය / முகவரி / Address : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල. / 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை / 2nd Floor, Block D, Sethsiripaya- II Stage, Baththaramulla.
ඊ-මේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
ෆැක්ස්/ பெக்ஸ் / Fax : 0112187015

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office
සංවර්ධන අංශය :0112054164
ආයතන අංශය :0112054136
ගිණුම් අංශය : 0112054138